ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Statement No: HRC/PS/i/S15/10/25

සුරක්ෂිත අනාගතයක් ගොඩනැගීම: දරුවන්ගේ නීතිමය ආරක්ෂාව සවිමත් කිරීම

ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වර්ධනය වීම, විශේෂයෙන් ශාරීරික දඬුවම් කිරීම් පිළිබඳ සිදුවීම් ඉහළ යෑමක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. මෙම ක්‍රියා මගින් ශාරීරික හානි පමණක් නොව, දිගු කාලීන චිත්තවේගීය හානියක් ද ඇති කරනු ලබන අතර, සමහර අවස්ථාවල එය දරුණු කම්පනයන් සිදු කිරීමට හා සියදිවි නසා ගැනීමට පවා හේතු වී ඇත. මෙම බරපතල තත්වයන්ට ප්‍රතිචාර ලෙස, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන කිරීම සඳහා (19 වන පරිච්ඡේදය) පනත් කෙටුම්පතක් 2025 ජූලි 4 වන දින ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම පනත් කෙටුම්පතේ අරමුණ වන්නේ වයස අවුරුදු 18 ට අඩු ඕනෑම තැනැත්තෙකුටම එරෙහිව ශාරීරික සහ ශාරීරික නොවන කෲරතර, අවමන් සහගත සහ හානිකරවන්නා වූ සියලු දඬුවම් තහනම් කිරීමයි.

ශ්‍රී ලංකාවේ නීති දරුවන්ගේ ආරක්ෂාව සඳහා දැනටමත් ශක්තිමත් පදනමක් සපයයි. දණ්ඩ නීති සංග්‍රහය මඟින් දරුවන්ට කෲරත්වය අපරාධයක් ලෙස නම් කර ඇති අතර ළමා ආඥා පනත දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා ආරක්ෂණ ප්‍රතිපාදන දක්වා ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් ද කිසිදු තැනැත්තෙකු වධ හිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යනුවෙන් සහතික කෙරේ. ඒ අනුව, නිවසේදී, පාසල්වලදී, විකල්ප රැකවරණ මධ්‍යස්ථානවලදී හෝ අධිකරණමය ආයතනවලදී ශාරීරික දඬුවම් පැමිණවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට පටහැනි වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කරන්නේ මෙම ප්‍රතිසංස්කරණ සෑම පසුබිමකදීම ශාරීරික දඬුවම් අහෝසි කිරීමේ සාමූහික ප්‍රයත්නයක කොටසක් ලෙස තේරුම් ගත යුතු වන බවයි. විනය වැදගත් වන නමුත් එය, බිය හෝ හිංසනය මත නොව දරුවන්ගේ ගෞරවය සහ විශ්වාසය ගොඩනඟන ධනාත්මක සහ ගෞරවනීය ප්‍රවේශයන් මත පදනම් විය යුතුව ඇත.

මෙම ප්‍රතිසංස්කරණවල අරමුණ සහ වැදගත්කම මහජනතාව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ. දරුවන් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති නීති, නිසි අවධානයකින් හා දැනුවත්භාවයකින් යුතුව විවෘතව සාකච්ඡා කළ යුත්තකි. කෙසේ වෙතත්, ඒවා වැරදි ලෙස අර්ථගැන්වීම නොකළ යුතු අතර ව්‍යාකූලත්වයක් ඇති කරන සහ දරුවන්ගේ ආරක්ෂාව දුර්වල කරන නිශේධනාත්මක කතිකාවතක් බවට පත් නොකළ යුතුය. එවැනි ක්‍රියාමාර්ග මගින්, මෙම ප්‍රතිසංස්කරණ ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනීසිටින කණ්ඩායම් වලට හානි කිරීමේ අවදානමක් ද පවතී.

මෙම කාරණයේදී කේන්ද්‍රය වන්නේ දරුවාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිහිපත් කරයි. දරුවන් හානිවලින් ආරක්ෂා කිරීම නීතිමය

වගකීමක් පමණක් නොව සදාචාරාත්මක බැඳීමක් ද වේ. වැදගත් කරුණ වන්නේ, ශාරීරික දඬුවම් අහෝසි කිරීම යනු දරුවන් සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අධිකාරිය හෝ දරුවන්ට මහ පෙන්වීම සඳහා ගුරුවරුන් සතුව ඇති වගකීම අවතක්සේරු කිරීමක් නොවන බවයි.ඒ වෙනුවෙන් දරුවාට මහ පෙන්වීම සහ විනයගරුක කිරීම ආරක්ෂිතව, නිර්මාණාත්මකව සහ දරුවාගේ විශ්වාසය, ගෞරවය සාධනීය ආකාරයෙන් අවිහිංසාවාදීව සිදු කරන බව සහතික කිරීමයි. මෙය සහ සමස්තයක් ලෙස පවුල, අධ්‍යාපනඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සමස්තයක් ලෙස සමාජය විසින් බෙදා ගන්නා වගකීමකි.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2025.10.15